යම් කිසි පුවතකට සෘජුවම අදාළ නොවනා වාර්ගිකත්වයන් පුවත් වාර්තා කිරීමේදී ඉස්මතු කර නොදක්වන මෙන්, මාධ්‍ය ආචාර ධර්ම පවසයි. එසේ නමුත්, එය පිළිනොපදිනා මාධ්‍ය වාර්තාවන් තවමත් බොහෝ දක්නට ලැබේ.

එසේම, ඇතැම් පුවතක් වාර්තා කිරීමේදී කාන්තා බාහිර රූපය ඉස්මතු කරමින්, කාන්තාවන්ව ඔවුන්ගේ බාහිර රූපය ඔස්සේ හැඳින්වීමේ භාවිතාවක් ඇතැම් මාධ්‍ය යොදාගනී. ඒ, "රූමත්", "සුරූපී" වැනි විශේෂණයන් යොදාගනිමිනි. කෙසේ නමුත්, පුරුෂයෙකුගේ බාහිර රූපය ඉස්මතු කොට දක්වමින්, ඒ ඔස්සේ ඔවුන්ව හැඳින්වීමක් මාධ්‍ය තුළ දැකිය නොහැකි තරම් වේ.

ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මූල්‍ය සමාගම් පවත්වාගෙන යන මුවාවෙන් වංචාවන් සිදුකළ බවට චෝදනා ලැබ සිටිනා කාන්තාව සම්බන්ධයෙන් දිවයින ඉරිදා සංග්‍රහය (ඔක්. 16, 2022) තුළ පළ වූ ලිපියක්, ඉහත මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන් සඳහා නිදසුනක් සපයයි.

මෙම ලිපියෙහි අන්තර්ගතය දෙස බලන විට,

1) මෙම සිදුවීමට අදාළ එක අයෙකුගේ වාර්ගිකත්වයක් පමණක් "මුස්ලිම් ව්‍යාපාරිකයෙකු" ලෙසින් දැක්වීම කෙතරම් මෙම ලිපියට අදාළ වේද? මෙවැනි වාර්ගිකත්වයන් ඉස්මතු කිරීම් ඔස්සේ, එම වාර්ගිකත්වයන් සෘණාත්මක ලෙසින් ඒකාකෘතික නොවන්නේ ද?

2) එසේම, මෙම ලිපිය තුළ, අදාළ කාන්තාව "උපතින්ම රූමත්කම ලැබූ", "ඉතා රූමත්", "සුරූපිනියක්" ලෙසින් හැඳින්වීම භාවාතිශය වාර්තාකරණයක් නොවන්නේ ද? මෙසේ කාන්තාව ඔවුන්ගේ බාහිර රූපය ඔස්සේ හැඳින්වීම, ස්ත්‍රී පුරුෂ භාවය ඔස්සේ සිදුකෙරෙනා කොන් කිරීමක් නොවන්නේ ද?